**වරකාපොල ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වරකාපොල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වරකාපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවන ලද රු. 1,279,645 ක ණය වාරික මුදල් දේශීය ණය සංවර්ධන අරමුදලට ගැලපීම වෙනුවට ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ආපසු ගෙවන ලද මුදල් දේශීය ණය සංවර්ධන අරමුදලට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ණය වාරික අයවීම් නිවැරදිව ගිණුම්ගත කල යුතුයි. |
| (ආ) | ජංගම නොවන වත්කම් මිලදී ගැනීම සඳහා වැයකරන ලද එකතු වටිනාකම රු.967,649 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ප්‍රාග්ධන සහ අයහාර වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම සිදුකල යුතුය. |
| (ඇ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2020 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද ඖෂධ තොගය රු. 922,478 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2021 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වා තිබුණි. | වර්ෂය අවසානයට පවතින වත්කම් අත්හැරීමෙන් තොරව ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබුණු එකතුව රු. 421,038 ක වරිපනම් බදු හා අක්කර බදු සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් පමණක් ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වැය විෂය 05කට අදාල පුනරාවර්තන වියදම් රු. 405,809 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම සිදු කල යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ පරිසර ගිණුම අවලංගු කිරීමේදී ලැබූ පොලී හා ගිණුම් ශේෂයේ එකතු වටිනාකම වූ රු. 103,397 ක මුදල සමුච්චිත අරමුදලට ගැලපීම වෙනුවට ආදායම් ලෙස ගිණුම් තැබීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කල යුතුයි. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති කොම්පෝස්ට් පොහොර තොගයේ වටිනාකම රු. 51,000 ක් හා නොනිමි තොගය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුමේ සිට ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වර්ෂය අවසානයට පවතින නිමි හා නොනිමි කොම්පෝස්ට් තොගය ගණනය කර ගිණුම්ගත කල යුතුයි. |
| (ඌ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 23 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයේ සමීක්ෂණයෙන් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුයි. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 4 කට අදාලව රු. 95,391,801 ක් සඳහා අදාල උප ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | විවිධ අත්තිකාරම්, උපලේඛන ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | පිළිතුරේ සඳහන් පරිදි උපලේඛන නොමැති අතර ගිණුම් ශේෂ තහවුරු කර ගැනීම සඳහා ඊට අදාල උපලේඛන ඉදිරිපත් කල යුතුයි. |

### 1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ)

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| සබරගමුව පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 01/2010 | සමාලෝචිත වර්ෂය තුල සභිකවරුන් 27 දෙනෙකු වෛද්‍ය නොවන හේතූන් මත නිවාඩු ලබාගෙන | ගරු මන්ත්‍රීවරුන් සභාවට නොපැමිණි සෑම අවස්ථාවකදීම එම නිවාඩු නිත්‍යානුකූලව අනුමත කර | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | දරන චක්‍රලේඛයේ 7.4 (iv) ඡේදය | සභාවට නොපැමිණි අවස්ථා 70 කදී රු.990,000 ක සභික දීමනා ගෙවා තිබුණි. | ඇති බවත් අංක 1398/18-2005 ජුනි 08 දිනැති ගැසට් පත්‍රය අනුව කටයුතු කර ඇති බවත් දන්වා තිබුණි. | |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ සේවා නියුක්ති ආදායම යටතේ උපයනවිට බදු ගෙවීම් අංක 07 | ද්විතීය සේවයෙන් ලබන ආදායම රු.50,000ට අඩු වනවිට සියයට 10 ක්ද රු. 50,000 ට වැඩිවන ඕනෑම වටිනාකමකට සියයට 20 බැගින් උපයනවිට බදු අයකළ යුතු වුවද ප්‍රාදේශීය සභාවේ සේවය කරන මන්ත්‍රීවරුන් 11 දෙනකුට 2018 අප්‍රේල් සිට 2019 නොවැම්බර් දක්වා ගෙවන ලද දීමනා වෙනුවෙන් රු.476,723 ක් උපයන විට බදු අයකරගෙන නොතිබුණි. | ගරු මන්ත්‍රීවරුන්ට ලිඛිත පිළිතුරක් ලබා දෙන මෙන් දැනුම් දුන්බවත් මේ වන තෙක් ලිඛිත පිළිතුරක් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබී නොමැති බැවින්, ඔවුන්ගේ කැමැත්තක් නොමැතිව මුදල් වැටුපෙන් කපා නොහැරි බවත්, ඉදිරියේදී වැටුපෙන් කපා හැරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 31,999,942 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 27,392,493 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වරිපනම් ගාස්තු හිඟ මුදල රු.3,344,300 ක් විය. මෙය උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.1,285,241ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද 2020 වර්ෂයේ ගම් පුළුල් කිරීමේ තක්සේරුව අනුව අලව්ව පාර තුල්හිරිය වම කොටසේ වරිපනම් ඒකක 42 කින් | මෙම හිගය දිගින් දිගටම පැමිණ ඇති බවත් මේවන විට නව පරිගණක මෘදුකාංගයක් හරහා වරිපනම් බදු අය කරමින් පවතින බවත් මේ පිළිබඳ ඉදිරියේදී සොයා බලා කටයුතු කල යුතු බවත් දන්වා ඇති අතර රු.71,786 ක ශේෂය අය කර | හිඟ වරිපනම් බදු ශේෂයන් අයකර ගැනීමටත් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් ඊට අදාල උපයෝගි ලේඛන සමඟ සැසඳීමටත් කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂ 10 ත් 26 ත් අතර කාලයක් හිඟව පවතින ශේෂය රු.71,786ක් ද ඒ තුල පැවතුණි. | ගැනීම සඳහා නව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති බවත් දන්වා තිබුණි. | |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු අක්කර බදු හිඟ මුදල රු.222,619 ක් විය.සමීක්ෂණයක් සිදුකර බදු අය කළ හැකි ඉඩම් හඳුනාගෙන ලේඛන සංශෝධනය නොකිරීමෙන්, වසර 10 ත් 28 ත් අතර කාලයක් හිඟව පවතින අක්කර බදු ශේෂයන් ඒ තුල පැවතුණි.එමෙන්ම මුල්‍ය ප්‍රකාශන අනුව ශේෂය උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.50,640ක වෙනසක් පැවතුණි. | අක්කරබදු පිලිබඳ සතොයක්ෂණය මේ වන විට අවසන් කර ඇති බවත් එයින් ලද තොරතුරු පදනම් කරගෙන ශේෂයන් යාවත්කාලීන කිරීමට කටයුතුකර 2021 වර්ෂයේ මේ දක්වා රු. 56,780 ක මුදලක් එකතු කර ඇති බවත් දන්වා තිබුණි. | හිඟ අක්කර බදු ශේෂයන් අයකර ගැනීමටද, ලේඛන යාවත්කාලීන කිරීමටද කටයුතු කල යුතුයි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ජල ගාස්තු හිඟ මුදල රු.171,419 ක් වූ අතර ලේඛන නිසිපරිදි යාවත්කාලීනකර නිවැරදි ශේෂය හඳුනාගෙනද නොතිබුණි. | මාසික බිල්කිරීම හා ඇස්තමේන්තුගත මුදල අතර වෙනසක් දිගින් දිගටම ලේඛන වල පැවතෙන බවත් ලේඛන පරීක්ෂාකර බලා කපා හැරීමට කටයුතු කර කඩිනමින් නිවැරදි කර ගන්නා බවත් දන්වා තිබුණි. | හිඟ ශේෂයන් අයකිරීමටද, ලේඛන නිසිපරිදි යාවත්කාලීන කිරීමටද කටයුතු කල යුතුයි. |

(ආ) කුලී

----

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු විවිධ කඩකුලී හිඟ මුදල රු.469,910 ක් වූ අතර ලේඛන නිසිපරිදි යාවත්කාලීනකර නිවැරදි ශේෂය හා කාලය හඳුනාගෙනද නොතිබුණි. | ශේෂයන්ගේ වෙනසක් පවතින අතර වෙනස කපා හැරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | හිග කුලී අයකර ගැනීමටද කාල විශ්ලේෂණයන් යාවත්කාලීන කිරීමටද කටයුතු කල යුතුයි. |

(ඇ) වෙළඳ බලපත්‍ර

----------------

| | | |
|---|---|---|
| සභාව සතු කඩ කාමර 56 ක ව්‍යාපාර ආයතන සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් රු.56,000 ක ඇස්තමේතුගත ආදායමක් අහිමි වී තිබුණි. | නිරීක්ෂණ පිලිගන්නා බවත් නිවැරදි කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | අයකර ගත යුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ණයගැති ශේෂයන්ගේ වටිනාකම රු.11,271,282 ක් විය. මෙම ශේෂ අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග නිරීක්ෂණය නොවුණි. | ලැබිය යුතු ගිණුම් වල ශේෂ නිවැරදි කර නිවැරදිව කාල විශ්ලේෂණ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ලැබිය යුතු ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | එකතුව රු. 3,178,871 ක් වූ ගිණුම් ශේෂ 07 ක් දිගු කාලයක සිට අක්‍රීයව පවතින අතර ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | සොයා බලා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අක්‍රීය ගිණුම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුයි. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නව කාර්යාල ගොඩනැගිල්ලට උපකරණ මිලදී ගැනීමේදී 2019 මාර්තු 14 දිනැති පලාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2/2019 ට පටහැනිව ලියා පදිංචි සැපයුම් කරුවන්ගෙන් පරිබාහිර ආයතනයකින් රු. 1,937,360 ක වටිනාකමැති ලී බඩු මිලදීගෙන තිබුණි. තවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6. අනුව මිල කැඳවීමේදී අදාල භාණ්ඩවල පිරිවිතරයන් දක්වා නොතිබීම තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලැබීමට පෙර ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුව මිලදී ගැනීම් සිදුකර තිබීම යනාදී කරුණුද නිරීක්ෂණය විය. | පැරණි කාර්යාලයේ වහලය අබලන් වීම නිසා පැවති වර්ෂා කාලගුණ තත්ත්වය මත නව කාර්යාලයට පිවිසීමේ අත්‍යවශ්‍යතාවය නිසා ප්‍රාදේශීය වශයෙන් මිල ගණන් කැඳවීමේ අනුමැතියට යටත්ව සිදුකරන ලද බවත් මින් පෙර පිරිවිතර කැඳවීමක් සිදුකර නොතිබුණු බවත් ඉදිරි මිලදී ගැනීම්වලදී ලබා දුන් උපදෙස් පරිදි කටයුතු කරන බවත් දන්වා තිබුණි. | මිලදී ගැනීම් සිදු කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුයි. |
| (ආ) | නව ගොඩනැගිල්ලේ බිත්ති කබඩ් ගැසීම සඳහා යෝජිත සැලැස්ම හා පිරිවිතර රහිතව මිල ගණන් කැඳවා තිබූ අතර, ලංසු ඉදිරිපත් කල යුතු අවසාන දිනය 2019 දෙසැම්බර් 17 වුවද එදිනට පසුව ලංසු ඉදිරිපත් කරන ලද ආයතන 02 ක ලංසු ඉහත අවසාන දිනයේදී ලැබූ ලෙස සලකා දින මුද්‍රා තබා තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුව තමන් වෙත නොලද ලංසු 2 ක් හා ලැබුණු ලංසුව පදනම් කරගෙන | පැවති අයහපත් කාලගුණ තත්වය හමුවේ කඩිනමින් නව ප්‍රාදේශිය සභා කාර්යාල ගොඩනැගිල්ලට පිවිසීම සහ කාර්යාල ලිපිගොනු සුරක්ෂිතභාවය වෙනුවෙන් කටයුතු කිරීමට සිදුවීම නිසා කඩිනමින් සිදු කල කාර්යයක් බැවින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගන්නා බවත් ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන ලෙස විෂයභාර නිලධාරිට උපදෙස් දුන් | මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අරමුණු විධි විධාන ප්‍රකාරව සිදුකළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | සැපයුම්කරු තෝරාගෙන රු.1,850,000 ක් ගෙවීම්කර තිබීමෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අරමුණු හා විධිවිධානවලට පටහැනිව කටයුතු කර තිබුණි. | බවත් දන්වා තිබුණි. | |
| (ඇ) | නව සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිරියෙහි පිවිසුම් දොරටුව අසල පැති බිත්තිය සඳහා තිර ආවරණයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයට අදාල ඉල්ලීම 2020 ජූනි 13 දින ලැබී තිබූ අතර ඒ සඳහා මිල ගණන් කැඳවීම, ඉල්ලීමට පෙර එනම් 2020 මැයි 29 දින සිදුකර තිබුණි. තවද මේ සඳහා අනුමැතිය 2020 ජූනි 15 දින ලැබී තිබූ අතර ලංසු විවෘත කිරිම 2020 ජූනි 16 දින සිදුකර එදිනම ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ ලබා ගැනීම තුලින් මෙම කාර්යය විනිවිදභාවයකින් තොරව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව සිදුකර තිබූ අතර මේ සඳහා 2020 අගෝස්තු 13 දින රු. 250,800 ක් ගෙවා තිබුණි. | නිලධාරීන්ගේ අවශ්‍යතාවයන් ඉටුවන තෙක් වරින් වර එක් එක් අංශයන්ගෙන් ඉල්ලීම් ඉදිරිපත්කල ද පෙන්වා දෙන ලද ඉල්ලීමට පූර්වයෙන් මහා සභා අනුමැතියට යටත්ව සිදුකරන ලද කාර්යයක් බව දන්වා තිබුණි. | මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සිදුකළ යුතුයි. |
| (ඈ) | වරකාපොල පොල භූමිය කඩ කාමර ඉදිකිරීමේදී ගොඩනැගිලි සැලසුම අනුමත කිරීමට පෙර ගිවිසුම්ගත වී තිබීම, 11 අදියරේ ඇස්තමේන්තුව සභා සම්මත වීමට පෙර ගිවිසුම්වලට එළඹ තිබීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 අනුව මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල නොකිරිම, මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.4 හා මුදල් කොමිෂන් සභාවේ අංක FC/3/3/2013 හා 2013 ජූලි 26 දිනැති චක්‍රලේඛයට පටහැනිව එකතු වටිනාකම රු. 3,867,196 ක් සඳහා වෙන් වෙන්ව ඇස්තමේන්තු 02 ක් පිළියෙලකර එකම ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන අත්පොතෙහි 3.8 වගන්තියට අනුකූල නොවීම යනාදී කරුණු නිරීක්ෂණය විය. | කාර්මික නිලධාරීගේ නිර්දේශය පදනම් කරගෙන ගිවිසුම් ගතවී ඇති බවත්, වර්ෂය පුරා අදායම ලැබෙන ආකාරයට අනුව ඇස්තමේන්තු සකස් කර කර්මාන්ත සිදු කරනු ලබන බවත් දන්වා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |